# 39

# පුරාණ ජන ජීවිතය හා බැඳි මත්ස්‍ය කර්මාන්තය

*අනුරුද්ධිකා දිල්හානි*

මාංශ අනුභව කිරීම මිනිසාගේ ඈත කාලීන ජීවිතය හා බැඳී පැවතුණි. කරදිය, මිරිදිය, මත්ස්‍යයන් හා ගොඩබිමේ වසන සතුන්ගේ මාංශ සිය දෛනික ආහාර රටාවට එක්කර ගැනීමෙහි ලා ඔවුන් හුරුපුරුදු වූයේ නිරායාසයෙනි. මසුන් ඇල්ලීම ඔවුන් වසර දහස් ගණනකට ඉහතදී ජීවිකා වෘත්තියක් ලෙස සිදු කර ඇත. ශ්‍රී ලංකාවේ මත්ස්‍යයන් පිළිබඳ ආදිතම සාධකය ලැබෙන්නේ වසර මිලියන කිහිපයක් පමණ පැරණි මයෝසීන (Miocene) නිධිවලිනි. අරුක්කාව හා මිනිහාගල්කන්ද යන ස්ථානවලින් මයෝසීන මත්ස්‍ය පොසිල හමු වී ඇත. කුරුවිට බටදොඹලෙන, කිතුල්ගල බෙලිලෙන, ආදි ප්‍රාග් ඓතිහාසික ස්ථානවලින් හා අනුරාධපුර සල්ගහවත්ත, මන්නාරමේ මාතොට වරාය ආදී ඓතිහාසික කැණීම්වලින් මත්ස්‍ය අවශේෂ හමු වී ඇති අතර මානවයාගේ මසුන් පරිභෝජනය පිළිබඳ පැරණිතම සාධකය හමු වන්නේ රාවණා ඇල්ලෙනි. එම සාධකය නම් සත්ව අස්ථියකින් සාදා ගත් බිලී කොක්කකි. මෙහි කාලනිර්ණය අනුව එය ක්‍රි.පූ. 6000ට පමණ අයත් වේ. (Spoliya Zeylanica, Vol, 27. (1953) 133 - 138 pp) ලංකාව ඉන්දියන් සාගරයේ දූපතක් ලෙස පිහිටි නිසා කරදිය මසුන් හා රට අභ්‍යන්තරයේ වැව් හා ස්වාභාවික ගංගා, ඇළදොළ ආදියෙහි මිරිදිය මසුන් අතීතයේ සිට ම මෙරට ජනතාව ආහාරය සඳහා ගන්නට ඇත.

මෙරට ජනයා ක්‍රි.පූ. යුගයේ පටන් ම නාවික කටයුතු පිළිබඳ ව දැනුමක් තිබූ බව පැහැදිලි වේ. දේවානම්පියතිස්ස රජුගේ කාලයේ දී දඹකොළ පටුන සුප්‍රසිද්ධ වරායක් ව පැවති බව ''.... **නිරිඳුගේ කම්මයෙහි අනුයුක්ත වූ හෙතෙම දඹකොළ පටුනේ නැව් නැඟ මහ මුහුද තරණය කොට ස්ථවිරයන්ගේ වහන්සේ අධිෂ්ඨානයෙන් යෙදීමෙන් නික්මුණු දවසෙහි ම රම්‍ය වූ පැළලුප් නුවරට ගියේ ය''** යන **මහාවංස** සඳහනින් තහවුරු වේ. (ම.ව 1808) ශ්‍රී මහා බෝධිය වැඩමවීමේ දී බෝධි ශාඛාවක් රෝපණය කළ එක් ස්ථානයක් වන්නේ මහාජල්ලික කෙවුල් ගමයි. (**බෝධිවංසය**, (1999) 198 පිටුව)

කෙවුලෝ වනාහි ධීවරයෝය. ක්‍රි.පූ. 3වන සියවසේ දී පමණ කෙවුල් ගම් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පිහිටා තිබූ බවට තවත් සාධකයක් ලෙස දුටුගැමුණු කතා පුවත පෙන්වා දිය හැකිය.

''ගොළු මුහුද වෙරළ කෙළවර මී පුරවා මූණින් නමන ලද ඔරුවක් දුටු ජනපදවාසී පුරුෂයෙක් ඒ බව කාවන්තිස්ස රජුට දන්වූ අතර රජතුමා දේවිය මහ පෙරහැරකින් එතැනට ගෙන්වා මනා ලෙස සකස් කරන ලද



මඩුවක හිඳුවා මී වැළඳීමට අවස්ථාව ලබා දුන් බව'' **මහාවංසයේ** සඳහන් වේ. (ම.ව 22 : 49 50)

වෙරළෙහි ඔරුවක් දක්නට ලැබුණේ මුහුදෙහි මසුන් අල්ලන ලද නිසා විය යුතුය. නමුත් එය අතහැර දැමූ ඔරුවක් බව පෙනෙන්නේ වෙරළේ මූණින් නවා තිබූ හෙයිනි. නමුත් **මහාවංස** විස්තරය ම **රාජාවලියේ** සඳහන් වන අතර එහි අවසන තරමක් වෙනස් අයුරින් සඳහන් වේ. (**රාජාවලිය**, (1976) 171 පිටුව )

**රාජාවලියට** අනුව ''වේළුසුමන යෝධයා මී බලා ඇවිද මීගමු තොටමුණේ කෙවුලෝ ගොඩ ඇඳපු මහලු ඔරුවක බැඳි සැට රියන් මීවදය ගෙන ගොස් දොළ පසිඳලීය. ඒ මීය දුටු පටන් මීගමුව නම් විය .... ''යනුවෙන් සඳහන් වේ''. (**රාජාවලිය**, (1976) 171 පිටුව) **රාජාවලිය** විස්තරයට අනුව මීගමුව දුටුගැමුණු පුරාවෘත්තයට සම්බන්ධ වී ඇත. මේ නිසා අතීතයේ ධීවර කර්මාන්තය රට වටා මුහුදුබඩ ප්‍රදේශ ඇසුරේ ගොඩනැගී තිබූ බව පෙනී යයි.

පුරාණ ලංකාව තුළ කරදිය ධීවර කර්මාන්තයට වඩා රට අභ්‍යන්තරයේ කළ මිරිදිය ධීවර කර්මාන්තය පිළිබඳ තොරතුරු ලැබේ. සෙල්ලිපි බොහොමයක මසුන්ගෙන් අය කරන ගන්නා ලද බද්දක් පිළිබඳව හා ඉන් ලැබෙන ආදායම යෙදවිය යුතු ආකාරය පිළිබඳ ව තොරතුරු හමු වේ.

පෙරුමියන්කුලම් ගිරි ලිපියේ

''යහපතක්ම වේවා! වසභ මහ රජ තිහලක ප්‍රදේශයේ පලොනකරක වැවේ උදක ප්‍රාප්තිය ද වැවේ (අල්ලන ලද) මත්ස්‍යභාග ද සුදර්ශන නම් භාවනා ගෘහයෙහි පිළිසකර කටයුතු සඳහා තිරගම ආස්ථානයට දුන්නේය. භාණ්ඩාගාරික බතකගේ පුත්‍ර සයි කුමාරයා පතනගල නටඹුන් විහාරය පිළිසකර කිරීම සඳහා කෙතවලක වැවේ උදක ප්‍රාප්තිය ද වැවේ තම පිය - සන්තක කොටස වූ ප්‍රාප්ති ත්‍රය නොහොත් මත්ස්‍ය භාගය ද පරම්පරාවෙන් අයිති ප්‍රාප්තිය හා සකොටස ද අමර ආස්ථානයට අණබෙර ගස්වා ... ''යනුවෙන් සඳහන් වේ. (E. Z. Vol. I, 69-70pp)

මෙම ශිලාලිපියට අනුව තිහලක නම් දිස්ත්‍රික්කයේ පොළොනකරක සහ කෙතලවල නම් ජලාශ්‍රයන්හි ජලය පාවිච්චි කිරීම සහ මසුන් ඇල්ලීම වෙනුවෙන් ප්‍රදේශවාසීන් විසින් ගෙවිය යුතු බදු තිරගම සහ අමර නම් ගම් සභාවලට පූජා බව පැහැදිලි ය. එම ආදායම ගම්සභා විසින් ඒ ඒ ගම්මාන පන්සල තුළ වූ භාවනා මධ්‍යස්ථානවල පිළිසකර කටයුතු සඳහා යොදා ගත යුතු විය. මෙයින් කුඩා ග්‍රාමීය ජලාශ්‍රවලින් මසුන් ඇල්ලීම වෙනුවෙන් අය කළ බද්ද ග්‍රාමීය ආයතනවලට පැවරීමක් පිළිබඳ ව විස්තර කෙරේ.

කණිට්ඨ තිස්ස රජුගේ පුවරු ලිපියේ

මහවිල බනක දෙවබ අමාත්‍යවරයා ද ඔහුගේ පුතුන් වන මහමෙයත හා කුමතය විසින් මටකලයට කහපන පන්දහසක් ගෙවා උපාලව බීජක දිස්ත්‍රික්කයේ පදහටරක හා හකන කරක වැව්වල, ඇළවල අල්ලන ලද මසුන්ගෙන් සම්පූර්ණ මුදල දෙවරබක ආශ්‍රමයේ තෙල් සහ අනෙකුත් වියදම් සඳහා දෙන ලද බව සඳහන් වේ. (Inscriptions of Ceylon. (2001), Vol II (Part II), 146-147pp)

අනුරාධපුර රස්නක වැවේ ගිරි ලිපියෙහි,

සිවියටක මහසියර අමාත්‍යවරයාගේ මව දහනකර නම් වෙල්යායේ - කබුබ - කුබර අතිරේක කොටස ද, විහිකවිය වැවේ ඇළවල්වල අල්ලා ගන්නා ලද මසුන්ගේ කොටස ද පිදීය යනුවෙන් සඳහන් වේ. (I.C. Vol II (Part II), 249p.) එම ලිපියෙහි තවත් තැනක, අබදවරණය ගමෙහි වෙසෙන මුදමාරට ප්‍රදේශයේ ඇළවල්වලින් අල්ලන ලද මසුන්ගේ විකිණීමෙන් හිමි වූ කහවණු 60ක ආදායම මොරපාගිරිය ආශ්‍රමයෙහි වෙසෙන භික්ෂූන්ට දන් දුන් බව සඳහන් වේ. (I.C. Vol II (Part II), 249p.)

මෙයට අමතර ව තිඹිරි වැව ගිරි ලිපිය[11] (E.Z. Vol IV, 227 p) පෙරියකඩු විහාර ගිරි ලිපිය[12] (I.C. Vol II, (Part II) 177p) මඟින් ද මසුන් විකුණා ලැබෙන අය මුදල විහාරස්ථානවලට පූජා කළ බව සඳහන් වේ. මත්ස්‍ය භාගයෙන් ආදායමක් ලබන්නට නම් මසුන් ඇල්ලීම, විකිණීම හා ඒ ආශ්‍රිත (කරවල වේලීම වැනි) කර්මාන්ත පැවතිය යුතුය.

වසභ රජුගේ පෙරියම්කුලම් ලිපියේ මත්ස්‍යයින් ඇල්ලීම වෙනුවෙන් ගෙවිය යුතු බද්ද '**මතෙර මජිබික**' යනුවෙන් සඳහන් වේ. (E.Z. Vol I, 69-70 pp) 'මජිබික' යන වචනයට අර්ථ දක්වන මහාචාර්ය සෙනරත් පරණවිතාණ මහතා එය "මත්ස්‍ය භාග" මාළු ඇල්ලීමෙන් ලද කොටස ලෙස දක්වන අතර ම මජිබික යන්න හැම විට ම යෙදී ඇත්තේ වැවක් ගැන සඳහනින් පසුව බවත් එහෙයින් එහි තේරුම මත්ස්‍ය භාගය බවත් වැඩි දුරටත් සඳහන් කරයි. (පරණවිතාන එස්. (2002), 196 පිටුව) පැරණි ලංකාවේ වැවක සිටින මසුන් කෙනෙකුගේ පුද්ගලික දේපලක් බවට පත් වූයේ ඔවුන් ස්වකීය කෙනෙහි වූ ඇළකට පැමිණි විට පමණක් බව බුද්ධඝෝෂ හිමි සඳහන් කරයි. (**සමන්තපාසාදිකාව**, 330 පිටුව) "**මතෙර මජිබක**" පරිත්‍යාගය කෙලින් ම භික්ෂූන් වහන්සේ කෙනෙකුට පිරිනැමූ දෙයක් නොව ආගමික කටයුතු සඳහා මෙහි ආදායම යොදවන කොන්දේසි පිට ගම් සභාවකට පවරන ලද්දක් බව ගම්‍ය වේ.

මාළු වෙළඳාම පිළිබඳව සාක්ෂ්‍ය ලැබෙන්නේ නව වන ශතවර්ෂයේ පමණ සිටය. VIII අග්බෝධි රජු (ක්‍රි.ව 804 - 815) අනුරාධපුර නගරය තුළට පොහෝ දිනයන්හි දී මසුන් රැගෙන ඒම තහනම් කළ බව

පවෙසං විනිවාරෙසි උපොසථදිනෙසු සො
මච්ඡමංසසුරාදීනං අන්තොනගරමත්තනො



යන සඳහනට අනුව පැහැදිලිය. (ම.ව. 47:48) මෙයින් ගම්‍ය වන්නේ පොහොය දිනයන්හි හැර අනෙකුත් දිනවල මත්ස්‍යයින් නගරය තුළට ගෙන ඒම තහනම් නොවූ බවත්, එසේ ගෙන එන ලද්දේ නගරය තුළ වෙළඳාම් කිරීමට බවත් ය.

ඇතැම් වැව්වල මාළු ඇල්ලීම තහනම් කළ බව පෙනේ. දෙවන සේන රජුගේ බසවක්කුලම ශිලා ලිපියෙහි "***මෙම වැව්හි මස් මරන තැනැරැකගත් කෙවුළන් උසු .....***" යනුවෙන් බසවක්කුලම් වැවේ මාළු බෑම තහනම් කළ බව දැක්වේ. (I. C, Vol V (Part I), (2001) 48 p) නමුත් මෙබඳු තහනමක් නොපනවන ලද වෙනත් ජලාශ්‍රවල මාළු බෑම රජය විසින් අනුමත කළ බව මෙයින් ගම්‍ය වේ.

අනුරාධපුර යුගයේ ජලාශ්‍රවල මසුන් ඇල්ලීම වෙනුවෙන් අය කරන ලද බද්ද පොළොන්නරුව යුගය අවසානය තෙක් පැවති බව නිගමනය කළ නොහැක. නිශ්ශංකමල්ල රජුගේ කාලයේ දී "***.... නුවර හාත්පසින් ම සත් ගව්වක් පමණ තැනැ හැම සතුන් නොමැරිය හැක්කැයි අභය දී බෙරය ලවා දොළොස් මහවැ තැනැ මසුන්ට අභය දී ....***" යනුවෙන් සඳහන් වේ. (E. Z Vol II - 78 p)

මෙම ලිපියට අනුව වැව්වල මසුන් මැරීම තහනම් කොට අභයදානය දුන් බව පැහැදිලි ය. නිශ්ශංකමල්ල රජුගේ ගල්පොත ශිලා ලිපියෙහි මහවැව් ඇළ අමුණු බන්දවා විසම්බුරුවත (පිසම්බුරුවත) නම් බද්ද අවලංගු කළ බව සඳහන් වේ. (E. Z Vol II - 105 p ) මේ ලිපියෙන් පෙනී යන්නේ පියඹුරුවත වැව්වලින් ගත් බද්දක් බවත් එනම්, වැව්වල ඇල්ලූ මාළුවලින් රජයට ලැබිය යුතු කොටස යන්න එයින් අර්ථ ගැන්වෙන බව, සෙනරත් පරණවිතාන මහතා සඳහන් කරයි. (**ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය**, (II භාගය) (1972) 522 පිටුව)

මේ අනුව මසුන් ඇල්ලීම වෙනුවෙන් අය කරන ලද බද්ද පොළොන්නරුවේ නිශ්ශංකමල්ල රජුගේ කාලය උදාවන විට පැවති බවත්, පසු ව රජු මෙම බද්ද අහෝසි කරන ලද බවත් නිගමනය කළ හැකිය.

වසර ගණනකට පෙර සිට ම මිනිසා මසුන් අල්ලා ගනු ලැබුවේ සරල ක්‍රමවලින් වන අතර එම ක්‍රමවල සාර්ථක බව කියාපාන හොඳ ම සාධකය නම් වර්තමානය දක්වා ම ඒ ඇතැම් විධික්‍රම නොනැසී පැවතීමයි. **සමන්තපාසාදිකාවේ** මසුන් ඇල්ලීම සඳහා භාවිත කරන ලද ක්‍රම විධි තුනක් පිළිබඳ ව සඳහන් වේ. (**සමන්තපාසාදිකාව**, (2003) 315 පිටුව) එනම්, බිලිය (බලි), දැල (ජාල), කෙමන (කුමීන) යන උපකරණ භාවිතයයි. බිළී බෑම මඟින් මසුන් අල්ලා ගැනීම පුරාණ යුගයේ සිට ම පැවත එන ක්‍රමයයි. ලංකාවේ ඒ පිළිබඳ ව පැරණි ම සාධකය ලැබෙන්නේ රාවණා ඇල්ලෙන් බව පැහැදිලිය. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ මොහොන්ජොදාරොවෙහි ගෘහ උපකරණ අතර ලෝහයෙන් තැනූ බිළී කොක්කක් හමු වී තිබේ. (Agrawal D.P. 1984,)

බිළී කොකු භාවිතය පිළිබඳව **මහාවංසයෙන්** තොරතුරු ලැබේ. ගැමුණු කුමාරයා උපන් අවස්ථාවේ දී ඡද්දන්ත හස්තිරාජයෙක් තමාගේ පුත් ඇත් පොව්වා ඡන්දන්ත විලෙන් ගෙනවිත් මෙහි තැබූ බව සඳහන් වේ. (ම.ව 22:61)

තං තිත්ථසරතීරමහී දිස්වා ගුම්බන්තරෙ ඨිතං
කණ්ඩුලවේහා බාලිසිකො, රඤ්ඤො ආචික්ඛි තාව දෙ

යනුවෙන් බිලියන් මසුන් මරන කණ්ඩුල නම් බිලි වැදි තෙමේ තොටුපළෙහි සිටි ඇත් පොව්වා දැක රජුහට දන් වූ බවත්, ඒ ඇත් පොව්වා ගෙනවිත් පෝෂණය කළ බවත් සඳහන් වේ. (ම.ව 22:62) කණ්ඩල නම් මසුන් මරන්නා විසින් ප්‍රථමයෙන් දුටු හෙයින් ඒ ඇතු කණ්ඩුල නම් විය. (ම.ව 22:62) මේ අනුව ක්‍රි.පූ 3 වන සියවසේ දී බිළී කොකු යොදා මසුන් ඇල්ලීම ජීවිකාව කරගත් පිරිසක් සිටි බව පැහැදිලි ය. **ජාතක අටුවා ගැටපදයේ** ද බිළී වැද්දෝ ගැන සඳහන් වේ. (**ජාතක අටුවා ගැටපදය** (1961) 141 පිටුව)

ශ්‍රී ලංකාවේ දක්ෂිණ ප්‍රදේශයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පහළ කිරිඳිඔය නිම්නයේ තෝරා ගත් ස්ථාන කිහිපයක කැණීම් කළ අතර එහි දී කිරින්ද වරාය සහ කිරින්ද ගොඩාන යන ස්ථාන දෙකෙන් මත්ස්‍ය අස්ථි කොටස් හමු වී තිබේ. (Archaeologia - (2004) 17p) කිරින්ද වරායේ නාගරීකරණය පිළිබඳ ව සාධක හමුවන හතරවන ස්ථානයෙන් හා දහ හතරවන ස්තරයෙන් ලෝහයෙන් කරන ලද බිළී කොකු දෙකක් හමු වී ඇත. (Archaeologia - (2004) 17p) එය ආහාර සඳහා මිනිසුන් මසුන් ඇල්ලීම කළ බවට ඇති හොඳ ම සාධකයකි.

දැල හා වීසි දැල වතුර පිරුණු වැව්වල මසුන් ඇල්ලීම සඳහා භාවිත කරන ලද තවත් උපකරණ ද්වයකි. "දැල" යන වචනය **සමන්තපාසාදිකාවේ** සඳහන් ව තිබේ. (ස.පා. 315 පිටුව) සීගිරි තදාශ්‍රිතයේ ඊසාන දිග මෝසම් සුළං කාලයේ දී විසිදැල වැව මත සකස් කරනු ලැබේ. එය දව කණු දෙකක් ආධාරයෙන් අඩි 06ක් පමණට සකස් කෙරේ. (ගුණවර්ධන, පී. 2004, 116 පිටුව)

14වන සියවසට අයත් **සද්ධර්මරත්නාවලියේ** ''කෙවුල් ප්‍රධානියෙකුගේ පිරිවර කුඩ මස්සන් මැරීම සඳහා ගඟට මහ දැලක් දමූ අතර එම දැලට රන්වන් කුඩ මසුන් හසු වූ බව සඳහන් වේ. (**සද්ධර්මරත්නාවලිය**, 1012 පිටුව) මසුන් ඇල්ලීම සඳහා දැල භාවිත කරනු ලැබූ බව සඳහන් වන නිසා මෙම ක්‍රමය පුරාණයේ සිට ම මසුන් මැරීම සඳහා යොදා ගන්නට ඇතැයි සිතිය හැකිය.

වර්තමානයේ ලංකාවේ බොහෝ ප්‍රදේශවල මසුන් ඇල්ලීම සඳහා කෙමන, කරක් ගැසීම, මුල් කූඩුව කූඩය, වහ තැළීම වැනි විධික්‍රම යොදා ගැනේ. කරක් අතීතයේ සිටම මසුන් ඇල්ලීම සඳහා භාවිත කරන ලද උපකරණයක් බව සඳහන් වේ. රොබට් නොක්ස් ග්‍රීස්ම කාලයේ දිය කඩිති, ඇළදොළවලින් මසුන් අල්ලා ගැනීමේ පහසු ක්‍රමයක් ලෙස කරක හෙවත් කරප් ගෙඩිය හඳුන්වා ඇත. (Knox, Robert. (1958), 142p)



කූරටියා කෝටුවලින් රවුමට පාදම මහත් ව මුදුන කුඩා වන පූනීලයක හැඩැති ව නිමවා ඇති ''කරක'' මසුන්ට රිංගා යාමට ඉඩ රහිත වන ලෙස මසුන් ඇතැයි සිටින ස්ථානවල මඩෙහි ඇනෙන පරිද්දෙන් ගසනු ලැබේ. එතුළට මසුන් අසු වූ විට ඔවුන්ගේ දඟලීමෙන් මසුන් මරන්නාට ඒ බව දැනේ. එවිට කරකය මුදුනේ ඇති අත දැමිය හැකි ප්‍රමාණයේ විවරයෙන් කරක් ගෙඩිය තුළට අත දමා මසුන් අල්ලාගෙන උන්ගේ කරමලය සිදුරු කර වැලක අමුණන අතර වැල මාළුන්ගෙන් පිරීගිය විට මාළු ඇල්ලීම අවසන් වන බව නොක්ස් සඳහන් කරයි. (Knox, Robert. (1958), 142p) අනුරාධපුරය, පොළොන්නරුව යුගයන්හි වැව්වල මසුන් ඇල්ලීමේ දී මේ ක්‍රමය භාවිත කරන්නට ඇතැයි සිතිය හැක්කේ 14වන සියවසට අයත් මූලාශ්‍රයවල සඳහන් වන බැවිනි. මේ නිසා පුරාණයේ ජනයා මසුන් ඇල්ලීම සඳහා ''**කරක**'' ප්‍රයෝජනයට ගන්නට ඇත.

මසුන් ඇල්ලීම සඳහා භාවිත කළ තවත් ක්‍රමවේදයක් ලෙස "**කෙමන බැඳීම**'' හඳුන්වා දිය හැකිය. **සමන්තපාසාදිකාවේ** මාළු ඇල්ලීමේ ක්‍රම අතර ''**කුමීන**'' යන්න සඳහන් වේ. (ස.පා. 366 පිටුව) කුමීන යන්නෙහි සිංහල අර්ථය ''**කෙමින**'' විය යුතු බව මහාචාර්ය ඉන්ද්‍රකීර්ති සිරිවීර මහතා සඳහන් කරයි., (සිරිවීර, 250 පිටුව)

කෙමන වේවැල් භාවිත කරමින් සකස් කරගනු ලබන සිලින්ඩරාකාර උපකරණයක් වන අතර එය ගලා යන ජලය ඇති තැන්වල ගැසීමෙන් මත්ස්‍යයන් එකතු කරගත හැකිය. එය වෙත මසුන් ඇඳ ගැනීම සඳහා ශාක ද්‍රව්‍ය හා වෙනත් කෑම වර්ග දමන අතර මේ මත පහන් දැල්වීම මගින් ද මත්ස්‍යයන් එකතු කර ගත හැකි බව නන්දදේව විජේසේකර මහතා පෙන්වා දෙයි. (විජේසේකර, එන්. (1955) 175 පිටුව)

ලීයෙන් හෝ වේවැල්වලින් හෝ තනා ගන්නා ලද දිග පැසක් වූ කෙමන ගැන **ජාතක අටුවා ගැටපදයේ** ද සඳහන් වේ. (**ජාතක අටුවා ගැටපදය**, 141 පිටුව)

මේ අනුව අතීතයේ සිට ම මසුන් ඇල්ලීම සඳහා උගුල් ඇටවීමේ තාක්ෂණයක් භාවිත කළ බව පැහැදිලි ය.

මසුන් ඇල්ලීමේ තවත් ක්‍රමයක් වූයේ මත්ස්‍යයින් මත්කරවීම සඳහා ගෙඩි වර්ග (මදන ඵලවිසාදිනි) ජලාශ්‍රවලට දමා ඔවුන් මත් වූ පසු අල්ලා ගැනීමයි. **සමන්තපාසාදිකාවේ**, නියං කාලයෙහි සැඬ පහර සිඳී ගිය කල්හි කිසියම් වළක ජලය රඳා පවතී නම් මසුන් අල්ලා ගැනීම පිණිස කුකුරුමාන් ගෙඩි, විෂ ආදිය දැමූ බව සඳහන් වේ. (ස.පා. 316 පිටුව)

මේ ආකාරයට විවිධ ක්‍රම භාවිත කරමින් මිනිසාගේ පරිභෝජනය සඳහා අවශ්‍ය මසුන් අල්ලා ගැනීම සිදු කළ බව පැහැදිලිය. ඇතැම් අවස්ථාවල දී රාජානුග්‍රහය යටතේ මෙම කර්මාන්තය සිදුකළ අතර අල්ලා ගන්නා ලද මසුන්ගෙන් බද්දක් අය කළ බව ඉහත සඳහන් කළ සෙල්ලිපි විමර්ශනය කිරීමේ දී පෙනී යයි.

කුඩා වැව්, පොකුණු හා ඇළ මාර්ග අයිති පුද්ගලයන්ට (සස්සාමික) මත්ස්‍යයන් පිළිබඳ වූ අයිතිය සම්බන්ධයෙන් තොරතුරු හමුවේ. **සමන්තපාසාදිකාවට** අනුව තමන් විසින් ඉදිකර ගන්නා ලද කුඩා වැව්වල අයිතිකරුවන් සිටි අතර ඒ හා සම්බන්ධ කුඹුරුවලට යාමට තිබූ ඇළ මාර්ග ද පෞද්ගලික අයිතියේ පැවතිණ. නිවාස පිටුපස මසුන් ඇති කිරීම උදෙසාත් ජලය ලබා ගැනීම උදෙසාත් පොකුණු සකස් කොට තිබුණි. මෙම පෞද්ගලික වැව්, පොකුණු හා ඇළ මාර්ගවලින් බාහිර පුද්ගලයන් විසින් මසුන් ඇල්ලීම සොරකමක් වූ බවත් එයට දඬුවම් ලෙස අල්ලන ලද මත්ස්‍යයින්ගේ වටිනාකම ගෙවිය යුතු බවත් එහි සඳහන් වේ. (ස.පා.330 - 331 පිටු)

අතීතයේ දී මිනිස්සු ගංගා ඇළදොළ ආදියෙහි මසුන් අල්ලා ගැනීම සඳහා බිළී කොකු, දැල්, විෂ ගෙඩි වර්ග භාවිත කළහ. ක්‍රමයෙන් ජනගහනය වර්ධනය වන විට විශාල මසුන් ප්‍රමාණයක් අල්ලා ගැනීමට අවශ්‍ය විය. මේ නිසා ගැඹුරු දියට යාත්‍රා කිරීමට සිදු විය. මුල දී ලී කොටයක් හාරා ඔරුව සකස් කර ගත් අතර පසු කාලය වන විට විවිධ තාක්ෂණික හා ශිල්පීය ක්‍රම භාවිත කරමින් අභ්‍යන්තර ජලාශ්‍රවල පමණක් නොව මුහුදේ පවා ධීවර කටයුතු කිරීමට හැකි යාත්‍රා නිපදවන ලදී. පසුකාලීන ව ධීවර කර්මාන්තය ඇසුරින් කරවල වෙළඳාම වැනි අතුරු කර්මාන්ත තවත් සංකීර්ණ වූ බව නිසැකය. වර්තමානය වන විට ධීවර කර්මාන්ත ලංකාවේ මුහුදුබඩ පළාත් ආශ්‍රිත ව මහා පරිමාණයෙන් කරගෙන යන කර්මාන්තයක් බවට පත් ව ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


01. **ජාතක අටුවා ගැටපදය**, (1961) (සංස්:) විමලකිර්ති හිමි, මැද උයන්ගොඩ, ඇම්.ඩී ගුණසේන සහ සමාගම, කොළඹ.
02. **බෝධිවංසය**, (1999) (සංස්:) ගම්ලත්, සුචරිත සහ වික්‍රමසිංහ ඊ.ඒ. එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
03. **මහාවංසො**, (1959) (සංස්:) බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.
04. **රාජාවලිය**, (1976) (සංස්:) සුරවීර. ඒ.වී., සීමාසහිත ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම, කොළඹ.
05. **සද්ධර්මරත්නාවලිය** (2007). (සංස්:) ඤාණවිමල හිමි, කිරිඇල්ලේ. ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.
06. **සමන්තපාසාදිකා විනයට්ඨකතා**, (2003). සංස්:) ධම්මකුසල හිමි, අම්බලන්ගොඩ, රාජකීය ආසියාතික සංගමය, කොළඹ.
07. Epigraphia Zeylanica Vol I, (1904).Wickramasinghe, D.M.D.Z. Oxford University Press, London.
08. Epigraphia Zeylanica Vol II, (1928).Wickramasinghe, D.M.D.Z. Oxford University Press, London.





09. Epigraphia Zeylanica Vol IV, (1943).Paranavithane, S. Oxford University Press, London.
10. Historical Relation of the Island of Ceylon. (1958).Knox, Robert. Thisara Publishers, Dehiwala,
11. Inscriptions of Ceylon, Vol V, (2001).Ranawella, S. Department of Archaeology, Colombo.
12. Spoliya Zeylanica, Vol, 27. (1953).. "Some Asdpect of the Prehistory of Ceylon" - Part III, Balangoda Culture, Department of National Museum, Colombo.


## ද්විතීයික මූලාශ්‍රය


01. ගුණවර්ධන, පී. (2004) පුරාණගම, සමන්ති ප්‍රකාශකයෝ, ජා-ඇල.
02. පරණවිතාන එස්. (2002) ශිලා ලේඛන සංග්‍රහය IV වෙළුම, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.
03. විජේසේකර, නන්දදේව, (1955). ලංකා ජනතාව, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.
04. **ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය**, (1972) (II භාගය) විද්‍යාලංකාර පිරිවෙනෙහි ප්‍රකාශයකි, කොළඹ
05. සිරිවීර, ඉන්ද්‍රකීර්ති., (2009) **රජරට ශිෂ්ටාචාරය සහ නිරිත දිග රාජධානි**, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ.
06. Agrawal, D.P. (1984).The Archaeology in India, Select Book, Service Syndicate, New Delhi.